සැ. යු. - මෙවර ගැසට් පත්‍රයේ VI කොටසේ ජූරි සභික නාමාවලියක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,555 - 2008 ජූනි මස 20 වැනි සිකුරාදා - 2008.06.20

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 689 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි *උනන්දුවක්* දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ජූනි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජූනි මස 13 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වෘත්තීය සංවර්ධනය සඳහා ආධාර ලබාදෙන පුහුණු වැඩසටහන උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

**ආසියානු සංවර්ධන බැංකු අරමුදල් සපයන දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය(DEMP)**

දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ තෝරාගෙන ඇති අධ්‍යාපන ආයතන මගින් රැකියා ඉලක්කගත පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පාඨමාලා සඳහා ඉලක්ක කෙරෙනුයේ උපකාර අවශ්‍ය වන සිසුන් සඳහා රැකියා අවස්ථා සලසා ගත හැකි පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීමයි.

අ.පො.ස. (උ/පෙළ) විභාගයට පෙනී සිට රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මේ සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

යෝජිත පුහුණු කිරීම් ඇතුලත් කාණ්ඩ 2 ක් ඇත.

1. වෘත්තීයමය ඉල්ලුම් පාදක පුහුණු වැඩසටහන්/පාඨමාලා සඳහා තෝරාගෙන ඇති ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන මාස 3-9 දක්වා ක්‍රියාත්මක වන කෙටි කාලීන පාඨමාලා.

2. රැකියාස්ථ පුහුණුව සලසනු ලබන පෞද්ගලික හෝ රාජ්‍ය ආයතන මගින් පුහුණුව ලබාදෙන මාස 9 පාඨමාලා

පුහුණුව සඳහා ආධාර සපයනු ලබන පිළිවෙල

1. ඉල්ලුම් පාදක පුහුණුව සඳහා වන ඉහත පළමු කාණ්ඩයට ඇතුළත් පාඨමාලා හදාරන්නන් වෙනුවෙන් පුහුණු ආයතනය වෙත ගෙවීම් කරනු ලැබේ. (මෙම පුහුණුව වෙනුවෙන් පුහුණුව ලබන්නා වෙත කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.)

2. රැකියාස්ථ පුහුණු පාඨමාලා ඇතුළත් ඉහත 2 වන කාණ්ඩය වෙනුවෙන් පුහුණුවන්නන් හට මාස 9ක කාලය සඳහා මාසිකව ආහාර, ගමන් වියදම් සහ අහඹු වියදම් සඳහා දීමනාවක් ගෙවනු ලැබේ.

සියළුම ඉල්ලුම්කරුවන් පහත සඳහන් උපමානයන් සපුරාලිය යුතුවේ.

1. වයස - 2007.12.31 දිනට අවුරුදු 30ක් හෝ ඊට අඩුවිය යුතුය.

2. පවුලේ ආදායම මාසිකව රුපියල් 20,000ට අඩුවිය යුතුය. (ග්‍රාම නිලධාරී තැන ලබා දෙන නිර්දේශය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කොට ඉදිරිපත් කළ යුතුය.)

3. ඉල්ලුම්කරු උසස් පෙළ විභාගයට පෙනී සිට රැකියා අපේක්ෂිත අයෙක් විය යුතුය.

දැනටමත් විශ්ව විද්‍යාල, විද්‍යා පීඨ හෝ අනෙකුත් රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරන ද්විතීයික පුහුණු පාඨමාලා පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව සහතිකපත්, ඩිප්ලෝමා හෝ උපාධි යනාදී වැඩසටහන් වලට සහභාගී වන හෝ සහභාගී වීමට තේරී ඇති අයවළුන් මේ සඳහා ඉල්ලුම් නොකළ යුතුයි.

තෝරා ගනු ලබන පුහුණුවන්නා දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සමඟ අදාළ පාඨමාලාව සඳහා වන වියදම වෙනුවෙන් හා නියමිත පරිදි පාඨමාලාව සම්පූර්ණ කිරීම වෙනුවෙන් බැඳී සිටින්නා වූ ගිවිසුමකට අත්සන් කළ යුතු වේ.

ඉල්ලුම්පත් පහතින් දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව සකස් කොට ඉහතින් ඉල්ලා ඇති ලේඛන හා සහතිකපත් ඇතුළත් කොට පහත දැක්වෙන ලිපිනය වෙත යොමු කළ යුතු වේ. මෙම ඉල්ලුම් පත්‍රය දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියෙහි අන්තර්ජාල www.nodes.lk යෙහිද දක්වා ඇත.

**මෙම ඉල්ලුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස් කරන ලද්දේ පරිගණක දත්ත බැංකුවට ඇතුලත් කිරීමේදී ඇතිවන අපහසුතාවන් හා වැරදි සහගත තොරතුරු ඇතුළත්වීම වැළැක්වීම සඳහාය.**

ව්‍යාපෘති අධ්‍යක්ෂක,
දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (**DEMP**)
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
පළමු සහ දෙවන මහල්,
35/10, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

## STIPEND PROGRAMME FOR CARREER DEVELOPMENT DISTANCE EDUCATION MODERNIZATION PROJECT MINISTRY OF HIGHER EDUCATION

### Application Form

1. Name in full (Capital Letters) :————.
2. Permanent Address (Capital Letters)
   Address Line 1 :————.
   Address Line 2 :————.
   Address Line 3 :————.
   City :————.
   2.(a) District :—. 2.(b) Grama Niladhari Div :——.
3. Telephone :—. (If any)4. Mobile :————. (If any)
5. Fax :——. (If any) 6. E-mail :————. (If any)
7. Family Income :————.
8. GN Income certificate (GN Division and No.) certified by DS (DS Division):————. (Y/N)
9. Temporary Address
   Address Line 1 :————.
   Address Line 2 :————.
   Address Line 3 :————.
   City :————.
   9.(a) District :——. 9.(b)Grama Niladhari Div. :——.
10. Telephone :——. (If any)11. Mobile:——. (If any)
12. Fax:——. 13. E-mail :——.(If any)
14. Date of Birth :—/—./19—.15. Age as at 31.12.2007 :——.
    (DD/MM/YYYY)
    (Attach a copy of BC)
16. Gender (M/F):——. 17. Marital Status : Married /Single
18. NIC No. :——. 19. Date of Issue :-:——./:——./:—.
    (Annex copy) (DD/MM/YYYY)
20. Passport No. :——.21. Date of Expiry :——./:——./:—.
    (Annex copy) (DD/MM/YYYY)
22. Nationality :——. 23. Race :——.
24. Preferred categories of Employment :
    *Only 5 categories can be selected, Please specify the preference Level (1 to 5)*

| *Category* | *Sub Category (Please Specify)* | *Pref.* |
|---|---|---|
| Accountancy | Eg. Accounts clerk, Trainee etc. | |
| Agriculture and livestock | | |
| Nursing | | |
| Automotive Mechanics | | |
| Computer & Information Tech. | Eg. Date entry operator, IT clerk etc. | |
| Electrical & Electronics | | |
| Fisheries & Aquaculture | | |
| Food & Beverages | | |
| Gem and Jewellery | | |
| Welding, Aluminium Fabricating, Spray Painting | | |
| Marine and Shipping | | |
| Metal & Light Eng. | | |
| Quantity Surveyor | | |
| Printing & packaging | | |
| Rubber Plastics & Leather Related | | |
| Textile & Garment | | |
| Beauty Culture | | |
| Secretarial | | |
| Food Processing & Packaging | | |
| Tourism and Hotel Industry | Eg. Receptionist, Cookery, Bakery etc. | |
| Other | | |

25. Indicate in which districts you would like to undergo Training :
(List 03 Districts in order of priority)

(i) ————.

(ii) ————. (iii) ————.

26. Educational Qualifications :
(indicate your best grading only for Mathematics & English)

*G.C.E. (O/L)* *Subject* *Grades*

year ————. Mathematics ————.
English Language ————.
(Attach copy of O/L certificate)

G.C.E. (A/L) - (Attach copy of A/L certificates)
Stream : Commerce/Mathematics/Science/Arts (Pls. Highlight)

| | Subject | Grades |
|---|---|---|
| Year 20.... First sitting | 1. ————. | ————. |
| | 2. ————. | ————. |
| | 3.————. | ————. |
| | 4. ————. | ————. |
| Year 20.... Second sitting | 1. ————. | ————. |
| | 2. ————. | ————. |
| | 3. ————. | ————. |
| | 4. ————. | ————. |
| Year 20.... Third sitting | 1. ————. | ————. |
| | 2. ————. | ————. |
| | 3. ————. | ————. |
| | 4. ————. | ————. |

27. Training Programmes and courses attended after completing GCE A/L :

| *Name of Institution* | *Course Title* | *Year* | *Duration* | *Grade Awarded* |
|---|---|---|---|---|
| .................. | .............. | ............. | ............. | ............... |
| .................. | .............. | ............. | ............. | ............... |
| .................. | .............. | ............. | ............. | ............... |
| .................. | .............. | ............. | ............. | ............... |
| .................. | .............. | ............. | ............. | ............... |

28. Additional Information :

| *Language Proficiency* | *Spoken* | *Reading* | *Writing* |
|---|---|---|---|
| English | .............. | ............ | ........... |
| Sinhala | .............. | ............ | ........... |
| Tamil | .............. | ............ | ........... |
| Other | .............. | ............ | ........... |

(Please Specify - Excellent, Very Good, Good, Fluent, Fair, Poor)

29. Employment History (If relevant)

| *Employer* | *Designation* | *Duration* period | *EPF No.* | *Job* Responsibility |
|---|---|---|---|---|
| ............. | ........... | ........To...... | .......... | .............. |
| ............ | ........... | ........To...... | .......... | .............. |
| ............ | ........... | ........To...... | .......... | .............. |
| ............ | ........... | ........To...... | .......... | .............. |
| ............ | ........... | ........To...... | .......... | .............. |

**Other Relevant Information**

30. Whether receiving grants already (Y/N) :---- If "Y" name of the grant and amount/month

31. Physical Fitness ————. (Y/N) (Certified by Physician)

32. Letters of Guarantors (Attach along with the application)

32.1 Parents ————. (Y/N) (If Parents are not living pl. give details of a close relative who would agree to be a guarantor)
Name (father/Mother) ————.
NIC No. (If available) ————.
Address -————.

32.2 Govt. Officer .————. (Y/N) (The Government Officer could also be a retired person)

Name ————. Position (held) ————.
NIC No.————. Salary Scale————.
Address ————. Tel. No. ————.

**For Office Use Only**

1. Ref No. ————. 2. Date Received : ---./--./200--- (DD/MM/YYYY)
3. Officer's Name ————.
4. Recommended/Not Recommended : -------------
5. Reasons for (4) above : -------------
6. Employment Prospects identified : ------------- (Y/N)
7. Approval Granted by : -------------
8. Valid From : ------------- (DD/MM/YYYY)
9. Rejected Date : ------------- (DD/MM/YYYY)
10. Reasons for Rejection : -------------
11. Others : -------------
12. Authorized by : ------------- 13. Date : -------------- (DD/MM/YYYY)

06-382

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.